මාධ්‍ය නිවේදන අංක 31

මැතිවරණ කොමිෂන් සභාව

## අවුරුදු 18 සම්පූර්ණ වූ විගස ඡන්ද බලය ලබාදීම.

1. 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ කරන තැනැත්තන් සඳහා ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වීමට පෙර පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් මගින් ඡන්ද බලය ලබාදීම සඳහා නෛතික ප්‍රතිපාදන සලසා ඇත.

2. මෙහි ප්‍රථම අදියර ලෙස 2021.06.01. දින සිට 2022.01.31 දක්වා කාල පරිච්ඡේදය තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කරන එනම් 2003.06.01 දින සිට 2004.01.31 දින දක්වා උපත ලැබූ පුරවැසියන්ගේ තොරතුරු YC ආකෘතියට ඇතුළත් කිරීම මගින් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා ජාතික හැඳුනුම්පත (හෝ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපියේ පිටපතක් ) සහ උප්පැන්න සහතිකයේ පිටපතක් සමඟ YC ආකෘතියක් වසමේ ග්‍රාම නිලධාරි වෙත 2022.01.10 දින හෝ ඊට පෙර භාර දිය යුතුවේ .

3. ලියාපදිංචි කිරීමට නිර්දේශ කර ඇති තැනැත්තන් කවුරුන්ද යන්න ගෘහමූලිකයාට දැන ගැනීමට සලස්වනු ලබන්නේ පරිපූරක ලැයිස්තු මගින් වන අතර එම ලැයිස්තු සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, පළාත් පාලන ආයතන කාර්යාලවල සහ ග්‍රාම නිලධාරි කාර්යාලවල 2022 පෙබරවාරි මස 01 දිනෙන් පසු ප්‍රදර්ශනය කරනු ලැබේ. ප්‍රදර්ශනය කරනු ලබන දිනයන් ගැසට් නිවේදනයකින් හා ප්‍රවෘත්ති පත්‍ර දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

4. පරිපූරක ලැයිස්තු පරීක්ෂා කර යම් තැනැත්තෙකු ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කර නොමැති බව පෙනී යන්නේ නම්, ලියාපදිංචිය සඳහා සුදුසුකම් ඇති ලිපිනය අයත් වන මැතිවරණ කොට්ඨාසයේ/ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරියා/ මැතිවරණ කාර්යාලය වෙත එම තැනැත්තාගේ ජාතික හැඳුනුම්පතෙහි හෝ උප්පැන්න සහතිකයේ පිටපතක් සමග හිමිකම් ඉල්ලුම්පතක් ඉහත කී ලේඛන ප්‍රදර්ශන කාලය ආරම්භ කළ දින සිට දින 10ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය හිමිකම් ඉල්ලුම්පත් ඉහත කී ලේඛන ප්‍රදර්ශනය කරන කාලය තුළ සියලුම ප්‍රදර්ශන ස්ථානවලින් ලබාගත හැකිය.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,

සරණ මාවත,

රාජගිරිය.

2021.12.31